# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR /PE/2020/4<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2020.03.6<br>திகதி |

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**සියලුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්**
**පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ කොමසාරිස්වරුන්/ ලේකම්වරුන්**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020
## රාජ්‍ය දේපල අවභාවිතය වැළැක්වීම සඳහා වන සම්බන්ධීකරණ නිලධරයෙකු නම් කිරීම

i. **රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම වැළැක්වීම සහ මැතිවරණ නීති බලාත්මක කිරීම**
ii. **මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන විධාන**

01. මෙම කරුණු සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නිකුත් කර ඇති රජයට සහ රාජ්‍ය සංස්ථාවලට/ව්‍යවස්ථාපිත ආයතනවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/උසස් කිරීම/මාරු කිරීම සීමා කිරීම සම්බන්ධ අංක EC/EDR/PE/2020/4 හා 2020.03.03 දිනැති චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. 2020.04.25 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමට අදාළව රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමේ පැමිණිලි/ මැතිවරණ ආරවුල් සම්බන්ධයෙන්, සිදුකෙරෙන කාර්යයන්ට අදාළව ඒ ඒ අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා අමාත්‍යාංශ, රාජ්‍ය සංස්ථා හා එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩල යනාදියෙහි සම්බන්ධීකරණ කටයුතු සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්/ ආයතන ප්‍රධානීන් නියෝජනය කිරීම වස් කැබිනට් අමාත්‍යාංශවල දි අතිරේක ලේකම්වරයෙකු හෝ පාලන විෂයභාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ද දෙපාර්තමේන්තුවලදී , දෙපාර්තමේන්තුවේ ප්‍රධානී/ අතිරේක ප්‍රධානී හෝ එම මට්ටමේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු ද, පළාත් සභාවලදී ප්‍රධාන ලේකම්වරයා නියෝජනය සඳහා සුදුසු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයෙකුද, සංස්ථා/මණ්ඩල යනාදියෙහි පාලන විෂයභාර අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ද නම් කර එවන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

03. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයට අයත් රාජ්‍ය ආයතනවල පැමිණිලි සම්බන්ධ සම්බන්ධීකරණ නිලධාරියා නම් කර මේ සමඟ ඇති ආකෘතිය **(EC/EDR/PE/2020/4)** මගින් කඩිනමින් ෆැක්ස් මඟින් **(011-2868448/2877208)** හා තැපෑලෙන් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය, මැතිවරණ කොමිෂන් සභාව, සරණ පාර, රාජගිරිය යන ලිපිනයට එවන ලෙසත් අනෙකුත් දිස්ත්‍රික්වල රාජ්‍ය ආයතනවල පැමිණිලි සම්බන්ධයෙන් නම් කරනු ලබන සම්බන්ධීකරණ නිලධාරියා, අදාල දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

04. පළාත් සභා අමාත්‍යාංශවලදී ඒ ඒ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා ද, ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයට සම්බන්ධයෙන් ආණ්ඩුකාරවර ලේකම්වරයා ද පළාත් දෙපාර්තමේන්තු හා පළාත් සභාව යටතේ ඇති වෙනත් ආයතනවලදී අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානී ද මහානගර සභාවල දී, නාගරික කොමසාරිස් හෝ නාගරික ලේකම් ද නගර සභා හා ප්‍රාදේශීය සභා වලදී සභාවේ ලේකම් ද මෙම සම්බන්ධීකරණ නිලධාරීන් ලෙස ක්‍රියාකරනු ලැබිය යුතු අතර මෙම ආයතනවල එම නිලධාරීන් පිළිබඳ තොරතුරු එකී පළාත්වල නියෝජ්‍ය / සහකාර / මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඒ සඳහා වූ ආකෘතිය **(EC/EDR/PE/2020/4)** මගින් දැන්වීමට කටයුතු කළ යුතුය.

05. මෙම තොරතුරු 2020.03.16 දිනට පෙර ලබා දීමට අවශ්‍ය බව සලකනු මැනවි.

**මහින්ද දේශප්‍රිය**
**සභාපති/ මැතිවරණ කොමිෂන් සභාව**
**(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)**

පිටපත් :- 1.**සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්** - දැන ගැනීම පිණිස හා නිසි කටයුතු සඳහා

2. **සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්** - මෙම ලිපියේ පිටපතක් හා ආකෘතියක් සුදුසු ආවරණ ලිපියක් සමග සියලුම පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ඇතුළු පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා පළාත් සභාව යටතේ ඇති මණ්ඩල / අධිකාරී යනාදී ආයතනවල ප්‍රධානීන් හා පළාත් පාලන ආයතනවල කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් වෙත නොපමාව යවා අදාළ තොරතුරු රැස්කර ගැනීම් හා අදාල තොරතුරු පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයන්හි කාර්යයන් සම්බන්ධීකරණය සඳහා යොමුකිරීම වස්

**(EC/EDR/PE/2020/4) චක්‍රලේඛය ලද බව සහ**
**මැතිවරණ පැමිණිලි සම්බන්ධීකරණ නිලධරයෙකු නම් කිරීම**

**(පහත සඳහන් ආකෘතිය ආයතනයේ නිල ලිපි ශීර්ෂයක සකස් කර එවීමට කාරුණික වන්නේ නම් වඩාත් මැනවි)**

අමාත්‍යාංශවලදී මෙම සහතිකය, ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයෙකු විසින් ද දෙපාර්තමේන්තුවක් වන විටදී දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අතිරේක ප්‍රධානියෙකු විසින් ද, සංස්ථාවක් හෝ මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විටදී සාමාන්‍යාධිකාරී/ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරක් හෝ ඒ හා සමාන තනතුරක් දරන නිලධරයෙකු විසින් ද අත්සන් කර එවිය යුතුය.

.........................................................................................................................................

- මෙම ආකෘතිය මැතිවරණ කොමිෂන් සභාවේ www. elections.gov.lk වෙබ් අඩවියෙන් ද තිබේ.
- පළාත් සභා අමාත්‍යාංශ/ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වන විටදී මේ ආකෘතිය එවිය යුත්තේ ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත බව සැලකුව මැනවි.

මගේ අංකය :- ..................................................
ඔබේ අංකය :- **(EC/EDR/PE/2020/4)**

(අදාල ආයතනයේ)
කාර්යාලයීය ලිපිනය
............................................................
............................................................
දිනය......................................................

**කාර්යාංශ ප්‍රධානී**
**මැතිවරණ ආරවුල් කළමනාකරණ කාර්යාංශය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය**
**මැතිවරණ කොමිෂන් සභාව/ ..............................................................**
**මැතිවරණ මහලේකම් කාර්යාලය**
**සරණ මාවත,රාජගිරිය**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020</u>**
**<u>රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම</u>**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් එවන 2020.03.03 දිනැති අංක EC/EDR/PE/2020/4 චක්‍රලේඛ අංක 03 ලද බවත්, එහි සඳහන් පරිදි රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා නිසි පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බවත්, එහි ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමට මා යටතේ ඇති සියලුම සංස්ථා සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුලු සියලුම මාණ්ඩලික නිලධාරීන් දන්වා යවන බවත් මෙයින් දන්වා සිටිමි.

02. මෙම අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/සංස්ථාව/අධිකාරිය (අදාළ නොවන කොටස් කපා හරින්න) සතුව ඇති වාහන පරිහරණය කිරීම/මුදාහැරීම සම්බන්ධව කටයුතු කරන නිලධාරියාගේ/නිලධාරීන්ගේ විස්තර මෙහි පහත සඳහන් කරමි. තවද මාගේ අත්සන, නම හා තනතුර සඳහන් ස්ථානයේ මාගේ දුරකථන අංකය ද සටහන් කරමි.

නම :..................................................................................................
තනතුර :..............................................................................................
කාර්යාල ලිපිනය:...................................................................................
දුරකථන අංක

i. කාර්යාලය:- ......................................................
ii. නිවස :-.........................................................
iii. ජංගම :-.........................................................
iv. ඉ-තැපැල :-.....................................................

............................................
අත්සන

............................................
නම සහ තනතුර

i. දුරකථන අංකය
ii. (රාජකාරී) :- ..................................................
iii. (නිවස) :- ..................................................